

# The Dinner Party
# රාත්‍රී භෝජන සංග්‍රහය

Mona Gardner

හෙල්මලී ගුණතිලක - පරිවර්තන

Original-The Dinner Party by Mona Gardner
Painting- 'The Dinner Party' by Jules-Alexandre Grün, source Wikimedia Commons

මෙය සිදුවන්නේ ඉන්දියාවේදී. බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නිලධාරියෙක් සහ ඔහුගේ බිරිඳ උත්කර්ෂවත් රාත්‍රී භෝජන සංග්‍රහයක් සංවිධානය කරනවා. ඔවුන් ද ඔවුන්ගේ අමුත්තන් සමඟ කෑම මේසයට වාඩි වී සිටිනවා. මේ අමුත්තන් අතර විදේශ තානා පතිවරු සහ ඔවුන්ගේ බිරින්දෑවරු මෙන්ම සංචාරයකට ආ ඇමෙරිකානු ස්වභාව විද්‍යාඥයෙක් ද සිටිනවා. මොවුන් වාඩිවී සිටියේ කිරිගරුඬ පොළොවක් සහ සිවිලිම් රහිත උස් වහලක් ඇති, බරාඳයට ඇරෙන විශාල වීදුරු ජනෙල් ඇති හොඳින් ඉඩකඩ ඇති කෑම කාමරයක.

තරුණ කෙල්ලක් සහ වියපත් හමුදා නිලධාරියෙක් අතර උණුසුම් සාකච්ඡාවක් පැන නගිනවා. ඈ කියන්නේ මේ වෙද්දී ගැහැණුන් මීයෙක් දුටු සැණින් පුටුවක් උඩට නඟින යුගය පසුකර ඇති බව. ඔහු කියන්නේ එය එසේ නොවන බව.

''ඕනෑම අර්බුදයකදී ගැහැනියක් නො වරදවා දක්වන ප්‍රතිචාරය බෙරිහන් දෙන එක'' හමුදා නිලධාරියා කියනවා. ''පිරිමි යකුටත් කෑගහන්න හිතෙන්න පුළුවන්, ඒත් ඔහුට ගැහැනියකට වඩා තමන්ව පාලනය කරගැනීමේ හැකියාව අවුන්සයක් හරි වැඩියෙන් තියෙනවා. ඒ අවුන්සය තමයි අන්තිමේදී වැදගත් වෙන්නේ''
ඇමෙරිකානුවා මේ සාකච්ඡාවට සම්බන්ධ නොවී අනෙත් අමුත්තන් දෙස විමසිල්ලෙන් බලනවා. ඔහු එසේ බලා හිඳිද්දී ගෙහිමි කාන්තාවගේ මුහුණේ අමුතු පෙනුමක් ඇති වන අයුරු දකිනවා. ඇය සීරුවෙන් ඉදිරිය බලා සිටින අතර ඇගේ මාංශ පේශීන් සියුම් ලෙස වෙවුලුම් කනවා. සුළු ඉඟියකින් ඇය තමන්ගේ පුටුව පසුපසින් හිඳින වැඩකාර කොලුවා කැඳවා, ඔහුට යමක් රහසින් කියනවා. ඔහුගේ දෑස පුදුමයෙන් මහත් වන අතර ඔහු වහා වහා කාමරයෙන් පිටතට යනවා.

මේ සිදුවීමවත්, කොලුවා බරාඳයේ විවෘත දොරවල් වලට එපිටින් කිරි බඳුනක් තබන අයුරු වත් ඇමෙරිකන්කරු හැර අමුත්තන් අතරින් වෙන කිසිවෙක් දකින්නේ නැහැ.

ඔහු වහා පියවි සිහියට එළඹෙනවා. ඉන්දියා වේදී කිරි බඳුනක් තැබීමෙන් අදහස් වන්නේ එකම දෙයයි- ඒ නාගයෙක් ඇල්ලීමට ඇමක් හැටියට. කාමරයේ කොතැනක හෝ නාගයෙක් සිටිය යුතු බව ඔහුට තේරුම් යනවා. මීට සුදුසුම තැන වන වහලයේ පරාල දෙස ඔහු නෙත් යොමනවා, ඒත් එතැන කිසිවක් නැහැ. කාමරයේ අනෙත් තුන් කෙළවර ම හිස්, හතරවෙනි කෙළවරෙහි සිටින්නේ ඊළඟ කෑම බඳුන් ගෙන එන්නට බලා සිටින වැඩකරුවන් පමණයි. තව ඉතිරි එකම තැනයි - ඒ මේසය යට.

ඔහුට මුලින්ම ආවේගයක් දැනෙන්නේ මේසයෙන් පසුපසට පැන අනෙත් අයට අනතුරු ඇඟවීමට. ඒත් එසේ කළහොත් නාගයා ද කලබල වී කවරෙකුට හෝ දෂ්ඨ කළ හැකි බව ඔහු දන්නවා. ඔහු ඉක්මණින් කතාකරනවා, එසේ කතාකරද්දී ඔහුගේ කටහඬ කොයිතරම් ප්‍රබල ද කියනවා නම් හැමදෙනාම ඉක්මණින්ම සන්සුන් වෙනවා.

''මට දැනගන්න ඕන මේ මේසේ වාඩිවෙලා ඉන්න අයගේ ස්වයං පාලන මට්ටම හරිය ටම කොයිතරම් ද කියලා. මම තුන්සීයට ගණන් කරනවා- ඒ කියන්නේ විනාඩි පහක්- ඔය එක්කෙනෙක් වත් එක මාංශ පේශියක් වත් හොලවන්න බැහැ. හෙලවුණු කෙනා රුපියල් පනහක දඩයක් ගෙවන්න ඕන. ලෑස්තියි නේ?''

ඔහු ගණන් කරද්දී මේසය වටා උන් විසි දෙනා හිඳ සිටින්නේ ගල් පිළිම ලෙසයි. ''සෙිය අසූවයි..'' කියද්දී මේසය යටින් මතු වූ නාගයා කිරි බඳුන වෙත ඇදී යන අයුරු ඔහු නෙත් කොණින් දකිනවා. ඔහු වහා වහා පැන බරාඳයට යන දොරවල් වසා දමද්දී කාමරය පුරා කෑ ගැසීම් හඬ දෝංකාර දෙනවා.

''ඔබ කීව දේ හරියටම හරි කර්නල්!'' ගෙහිමියා පුදුමයෙන් කෑගසනවා. ''සම්පූර්ණ ස්වයං පාලනය ගැන උදාහරණයක් මේ දැන් අපිට පිරිමියෙක් පෙන්නුවා''

''විනාඩියක් ඉන්න'' කියමින් ඇමෙරිකන්කරුවා ගෙහිමි කාන්තාව වෙත හැරෙනවා. ''වින්ස් මහත්මිය, කාමරය ඇතුලේ නයෙක් උන්නු බව ඔබ කොහොමද දැනගත්තේ?''

ඇය පිළිතුරු දෙද්දී ඇගේ මුහුණ සිහින් සිනාවකින් එළිය වෙනවා. ''ඌ මගේ කකුල උඩින් ඇදිලා ගිය නිසා!''

